**ලංසු දැන්වීම**

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීම- 2025/2026**

2025/2026 වර්ෂයක කාලයක් සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම පිණිස ලියාපදිංචි ආයතනවලින්, විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

1. **මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.**

I. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස පුවත්පත් දැන්වීම පළ වූ දිනට අවම වශයෙන් වර්ෂයකට පෙර ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

II. පිරිසිදු කිරීමේ සේවය සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික රෝහලක අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ බව අදාළ ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ලිපිය සමඟ සේවාව සැපයූ ආයතනයෙන් ලබා ගත් ලිපි සහ ගිවිසුම්වල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III. පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය

IV. පහත සඳහන් වගුවෙහි සඳහන් වටිනාකම්වලට කොන්දේසි රහිත බැංකු අයිරා පහසුකම් ලබා දෙන බවට කොන්ත්‍රාත්කරු ගනුදෙනු කරන බැංකුවෙන් නිකුත් කළ ලිපිය (මුල් පිටපත) (කොන්ත්‍රාත්කරු විසින් රෝහල් /ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන්නේ නම් එම රෝහල්/ආයතනවල වටිනාකම්වල එකතුවට සමාන හෝ වැඩි වටිනාකමට ලබාගත් සහතිකයක් විය යුතුය.) (ලංසු විවෘත කිරීමේ දිනයට පෙර මසක් ඇතුළත ලබාගත් සහතිකයක් විය යුතුය.)

V. පූර්වාසන්න වර්ෂය සඳහා තම ව්‍යාපාර ලියාපදිංචි නාමය යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම වෙනුවෙන් සේවයේ යොදවනු ලැබූ සියළුම සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/ සේවක භාරකාර අරමුදලෙන් නිකුත් කළ ලිපි/ කුවිතාන්සි / ප්‍රේෂණ නිවේදන ඇතුළත් පසුගිය වසර 03 තුළ මාස 12කට අදාළ ගෙවීම් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

VI. පූර්වාසන්න තක්සේරු වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ ආයතනය නමින් වැට් බදු/ආදායම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය.(සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල /හවුල් ව්‍යාපාර ආයතන සියළු හවුල්කරුවන්ගේ නමින් ද, පූර්වාසන්න වර්ෂය සඳහා ආදායම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය. 2023/2024 වර්ෂය සඳහා පමණි )

VII. පහත වගුවේ සඳහන් පරිදි රෝහලට අදාළ වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් සීදුව,කොළඹ පාර ලිපිනයෙහි වූ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් සභාපතිගේ නමට ලියන ලද ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට දින 119 ක කාලයකට වලංගු වන සේ ලබාගත් ලංසු බැඳුම්කරයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. **(2025.04.17 දින සිට 2025.08.13 දක්වා වලංගු විය යුතුය)**.

2. ලංසු අයදුම්පත් 2025.04.01 දින සිට 2025.04.15 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සීදුව,කොළඹ පාර ලිපිනයෙහි වූ විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ කාර්යාලයෙන් ලබා ගත හැකිය. ලංසු අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන රු. 3500 ගාස්තුවක් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ **සරප් අංශය** වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපත හා ලංසු ලියවිලි ඉල්ලුම් කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

| අනු අංකය | රෝහලේ නම | ප්‍රසම්පාදන අංකය | බැංකු අයිරා පහසුකම් ලබා ගත යුතු අවම වටිනාකම | ලංසු ඇපකරය (රු.) | ලංසු ලියවිලි ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|
| 1 | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල | WKMH/E4/19/24 | රු. 2,471,212.20 | රු.149,000.00 | රු.3500.00 |
| | | | | | |

3. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි **2025.04.17** දින **පෙ.ව. 10.00** ට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව සීදූව,කොළඹ පාර විජය කුමාරතුංග අනුස්මරණ රෝහල ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2025/2026 වර්ෂයේ පිරිසිදු කිරීමේ සේවාව සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

5. **2025.04.17** දින **පෙ.ව. 10.00** දක්වා සීදූව,කොළඹ පාර විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ කාර්යාලයේ දී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා ගණකාධිකාරි / පරිපාලන නිලධාරි අමතන්න. (දුරකථන අංක 011-2258862-4 )

6. පූර්ව ලංසු රැස්වීම 2025.04.08 දින **පෙ.ව 10.00** සීදූව,කොළඹ පාර විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ කාර්යාලයේ දී පැවැත්වේ

7. ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව ,
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,
කොළඹ පාර,
සීදූව.